# බුදුන් වහන්සේගේ ඤාණබලය හා උග්‍රතපස විග්‍රහ කෙරෙන මහාසීහනාද සූත්‍රය

- පූජ්‍ය ශාස්ත්‍රවේදී වැවල ධම්මාලෝක හිමි -

## හැඳින්වීම

මහා සීහනාද සූත්‍රය සූත්‍ර පිටකයේ මැදුම් සඟියේ මූල පණ්ණාසකයට අයත් සීහනාද වග්ගයේ දෙවැනි සූත්‍රය යි. එසේ වුවත් ත්‍රිපිටකයේ ස්ථාන කිහිපයක ම සීහනාද යනුවෙන් හඳුන්වා ඇති සූත්‍ර ගණනාවක් දක්නට ඇත.[i] මෙම දේශනාවලදී බුදුන් වහන්සේ තුළ පිහිටි උත්තර මනුෂ්‍ය ධර්ම, නිර්භයභාවය සහ මිථ්‍යා දෘෂ්ටි ප්‍රහාණය පිළිබඳ කරුණු විස්තර කොට ඇති ආකාරය පොදුවේ දක්නට ලැබේ. මෙහි සාකච්ඡාවට භාජනය වන මහාසීහනාද සූත්‍රයෙහි බුදුන් වහන්සේ කෙරෙහි පිහිටියා වූ දසබල ඥානය ඇතුළු අනෙක් උත්තර මනුෂ්‍ය ධර්මයන් සහ බෝධිසත්ව අවධියේ දී සිද්ධාර්ථ තාපසතුමන් විසින් පිළිපදින ලද අති දුෂ්කර අචේලක ආදී තපස් ව්‍රත පිළිබඳව විස්තර ඇතුළත් වේ. දඹදිව පහළ වූ මහා ශාස්තෘවරයාණන් හා විමුක්ති දායකයාණන් වශයෙන් බුදුන් වහන්සේ පිළිබඳ සමකාලීන සමාජයේ පැතිරෙමින් තිබූ වැරදි මත හා සැක සංකා දුරු කිරීම මෙවැනි දේශනා වල අරමුණ වූවා විය හැකිය. මෙවැනි දේශනා මගින් උන්වහන්සේ කෙරෙහි වූ සුවිශේෂ ඤාණ ශක්තීන් හා සද්ධර්මයේ උත්තරීතරත්වය පිළිබඳ සිංහයෙකු මෙන් නිර්භය ලෙස ලොවට ප්‍රකාශ කරන ලදී.

## සූත්‍ර සාරය

මහාසීහනාද සූත්‍රයේ විස්තර කෙරෙන ධර්මය තථාගතයන් වහන්සේ විසින් වදාරන ලද්දේ, විසාලාවේ නගර සීමාවෙන් පිටත බටහිර වන ලැහැබෙහි වැඩසිටින අවස්ථාවක දී ය. ලිච්ඡවි රාජ පුත්‍ර සුනක්ඛත්ත නැමති භික්ෂුව සිවුරු හැර ගිහි බවට පැමිණ නොබෝ කලකින් විසාලා නුවර වැසි පිරිස් රැස් කරවා බුදුන් වහන්සේ තුළ සාමාන්‍ය මිනිසෙකුට වඩා විශේෂ වූ ඥාණයක් නොමැත්තේ යැයි ප්‍රකාශ කරමින් සිටියේ ය. අග්‍රශ්‍රාවක සාරිපුත්ත තෙරුන්ට විසාලාවට පැමිණි අවස්ථාවේ දී සුනක්ඛත්ත විසින් බුදුන් වහන්සේ පිළිබඳ ජනතාව ඉදිරියේ කරනු ලබන මෙම ප්‍රකාශ අසන්නට ලැබිණි. අනතුරුව සැරියුත් තෙරුන් වහන්සේ විසින් භාග්‍යවතුන් වහන්සේට සුනක්ඛත්තගේ මෙම ප්‍රකාශ පිළිබඳව සැළ කරන ලදී. එම අවස්ථාවේදී බුදුන් වහන්සේ සුනක්ඛත්ත හිස් මිනිසෙකු බවත් තමන් වහන්සේ කෙරෙහි වූ උත්තර මනුෂ්‍ය ධර්මයන් දැනීමේ හැකියාවක් ඔහුට නොමැති බවත් සඳහන් කරමින් සාරිපුත්ත තෙරුන්හට තමන් වහන්සේ කෙරෙහි පිහිටියා වූ ඥාණ බල පිළිබඳ පහදා දුන්හ.

බුදුරදුන් තුළ පිහිටියා වූ ඥාණ බල පිළිබඳ විස්තරයෙන් අනතුරුව සූත්‍රයේ දෙවැනි අනුසන්ධිය වශයෙන් විස්තර කොට ඇත්තේ සිද්ධාර්ථ බෝසතාණන් විසින් පිළිපදින ලද අති දුෂ්කර ප්‍රතිපදාව යි. සුනක්ඛත්ත අචේලක ආදී දැඩි දුෂ්කර ප්‍රතිපදා පිරුමෙන් විමුක්තිය ලැබිය හැකි යැයි මිථ්‍යා ලබ්ධි ඇත්තෙක් විය.[ii] එබැවින් මෙහිදී බුදුන් වහන්සේ විසින් අනුගමනය කරන ලද අචේලකභාවය, රළු තපස්ව්‍රත, ප්‍රකෘෂ්ටවිවේකය, දුස්භෝජනය, අල්පාහාරය ආදී වූ දුෂ්කර පිළිවෙත් විස්තර කරන ලදී. බෝසතාණන් ගේ දුෂ්කර ප්‍රතිපදාව කෙතරම් උග්‍ර වූවක් ද යත් එය ලොව එම පිළිවෙතෙහි යෙදෙන කිසිවෙකුටත් නොදෙවෙනි වූවකි. මෙම ප්‍රතිපදාවන් පැහැදිලි කොට අවසානයේ දී බුදුරදුන් ප්‍රකාශ කරන්නේ "සාරිපුත්තය, මම ඒ දුෂ්කර ප්‍රතිපදාවෙන් මනුෂ්‍ය ධර්මයට වැඩි වූ ආර්යභාවයක් ප්‍රතිඥා කිරීමට සමත් වූ දර්ශන විශේෂයක් නො ලදිමි" යනුවෙනි.[iii] මෙහි දී බුදුන් වහන්සේ බොහෝ භවයන්හි ඉපදීමෙන් හා ගිනි පිදීමෙන් ශුද්ධිය වෙතැයි යන මිථ්‍යා ලබ්ධිය ද උන්වහන්සේ ප්‍රතික්ෂේප කළ හ.



බුදුන් වහන්සේගේ ඥාන ශක්තීන් ලොව කිසිදු ඥාන ලාභියෙකුට සම කළ නොහැකි තරම් වේ. ඒවායේ බලවත් බව ජීවිතය වියපත් වීමෙන් හෝ නැසී නො යයි. යම් තැනැත්තෙක් යොවුන් බව නැති වීයාමෙන්, වියපත්වීමෙන් හෝ ඥාණය නැසී යන්නේ යැයි කියන්නේ නම් එය බොහෝ දෙනා සම්බන්ධයෙන් සත්‍ය විය හැකි ය. එසේ වුවත් බුදුන් වහන්සේ කෙරෙහි එබඳු ප්‍රකාශයක් කළ නො හැක. උන්වහන්සේ කෙරෙහි පිහිටියා වූ ඥාණ බල අසූ වයස මුහුකුරා යාමෙන් වුව නො පිරිහෙන්නේ ය. වයෝවෘද්ධ වූ තථාගතයන් ඇඳක තබා පරිහරණය කරන්නේ වුව ද උන්වහන්සේගේ ප්‍රඥාව පිළිබඳ ව්‍යක්තභාවයෙහි වෙනසක් නො වන්නේ ය. මෙම දේශනාව පවත්වන අවස්ථාවේ දී නාගසමාල තෙරුන් වහන්සේ බුදුරදුන්ට පසුපසින් හිඳ පවන් සලමින් සිටියහ. මේ දේශනාව ඇසූ උන්වහන්සේ එය ආශ්චර්යමත් අද්භූත දේශනාවක් බවත් තමන්ගේ ලොමුදැහැගත් බවත් පැවසූහ. මෙම ධර්මක්‍රමය කුමක් දැයි විමසූ නාගසමාල හිමියන්ට බුදුරදුන් විසින් එය ලෝමහංස පරියාය වශයෙන් දරන්නැයි වදාරන ලදී. බුද්ධ දේශනා අතුරින් සමහරක් ආශ්චර්යමත් ඒවා වේ. මෙහි සඳහන් වන බුදුන් වහන්සේ විසින් උපදවා ගන්නා ලද ඥාණ ශක්ති හා උන්වහන්සේ අනුගමනය කරන ලද තපස් ව්‍රත පිළිබඳ විස්තර සාමාන්‍ය මිනිසෙකුගේ අත්දැකීම් සීමාව ඉක්මවා පවතී. ඒවා පිළිබඳ ඇසූ ශ්‍රාවකයෝ විශ්මයටත් බුදුන් කෙරෙහි අතිමහත් ශ්‍රද්ධාවටත් පත් වූහ. නවාංග ශාස්තෘ ශාසනයෙහි අබ්භූත ධම්ම යනුවෙන් සඳහන් වන්නේ මේ ආකාරයේ දේශනා විය යුතු ය.

## සනක්ඛත්තගේ ද්වේෂය

සිවුරු හැර ගිය සුනක්ඛත්ත බුදුරදුන් කෙරෙහි උත්තර මනුෂ්‍ය ධර්මයක් නෙමැති බව විසල් පුර වැසියන් ඉදිරියේ ප්‍රකාශ කිරීමට හේත

වන කරුණ මජ්ඣිම නිකාය අට්ඨකථාවේ සඳහන් වේ. බුද්ධ ශ්‍රාවකයෙකු වශයෙන් සිටිය දී සුනක්ඛත්ත වරක් බුදුරදුන් වෙත එළැඹ දිබ්බ චක්ඛු ඤාණය ලැබීම සඳහා පිළියම් විචාළේ ය. එහි දී බුදුන් වහන්සේ ඔහුට ඒ සඳහා හේතු සම්පත් තිබෙනු දැක දිවැස් පිණිස පිළියම් වදාළ හ. සුනක්ඛත්ත එම පිළිවෙතින් දිවැස් උපදවා දෙව් ලොව නොයෙක් තැන සරමින් දේවිවරුන්ගේ දිව්‍ය සම්පත් දැක ගත්තේ ය. පසුව ඔහුට මෙවන් දෙව් සැපත් විඳින දෙවිවරුන්ගේ හඬ කෙබඳු දැයි ඇසීමේ කැමැත්තක් ඇති විය. එබැවින් සුනක්ඛත්ත බුදුන් වහන්සේගෙන් දිව කන් ලැබීමට ද පිළියම් විචාළේ ය. බුදුන් වහන්සේ ඔහුට ඒ සඳහා හේතු සම්පත් නොමැති බව දැන පිළියම් නො වදාළ හ. මේ කරුණින් සුනක්ඛත්ත බුදුන් වහන්සේ හා සමවෙනු දැකීමට නොකැමති ව උන්වහන්සේ විසින් මේ සඳහා පිළියම් නො වදාරන ලදැයි සිතා වෛර බැඳගත්තේ ය. අනෙක් අතට තමාම පිළිවෙතින් උත්සාහ කොට දිබ්බ චක්ඛු ඤාණය ලැබූ බව පෙනී ගිය බැවින් එය බුදුරදුගෙන් පිළියම් නො ලැබුව ද ස්වඋත්සාහයෙන් කළ හැකි කාර්යයක් යැයි මානාධික වැටහීමක් ඔහුට ඇති විය. සිවුරු හැර ගිය සුනක්ඛත්ත විසින් "නත්ථි සමණස්ස ගෝතමස්ස උත්තරී මනුස්සධම්මා අලමරිය ඤාණදස්සන විසේසෝ" යැයි පිරිස් මැද ප්‍රකාශ කරන්නට විය. මෙයින් ඔහු දක්වා සිටියේ ගෞතමයන් කෙරෙහි මනුෂ්‍ය ධර්මයට වැඩි වූ සමථ විදර්ශනා ආදී විශේෂ අධිගමයක් නොමැති බව යි. එහි දී සුනක්ඛත්ත ගෞතමයන් වහන්සේ විසින් ජනතාව තමන් කෙරෙහි නම්මා ගැනීම සඳහා තර්කවිතර්කයෙන් ද (තක්කපරියාහත්ති) ලෞකික ප්‍රඥාවෙන් කරුණු ඔබ මොබ හැසිරවීමෙන් ද (වීමංසානුචරිතං) සක්විති රජෙකු මෙන් පිරිස් පිරිවරා මිහිරි තෙපුල් බිණීමෙන් ද ඒ ඒ කරුණු පිළිබඳ තමන්ට වැටහෙන කථා කීමෙන් ද (සයං පටිභානං) කටයුතු කරමින් සිටිනවා හැර කිසිදු උත්තරි මනුෂ්‍ය ධර්මයක් තථාගතයන් කෙරෙහි නොමැති බව ප්‍රකාශ කළේ ය.



සුනක්ඛත්ත ලිච්ඡවි රාජ පුත්‍ර යනු බලවත් ලෙස මිසදිටු සරණ ගිය තැනැත්තෙකි. ඔහු බුදුන් වහන්සේ සමග කෝප වීමත්, සිවුරු හැර යාමත් පිළිබඳ දීර්ඝ විස්තරයක් දීඝ නිකායේ පාථික සූත්‍රයේ සඳහන් වේ.[iv] හෙතෙම බුදුන් වහන්සේ විසින් තමන් ඉදිරියේ උතුරු මිනිස් දම් පෙළහර නො කරන්නේ නම් හා ලෝක උප්පත්ති කථාව නො වදාරන්නේ නම් තමන් සිවුරු හැර යන බව පැවසී ය. මේ අවස්ථාවල දී බුදුන් වහන්සේගේ අවවාදය වූයේ තමන් වහන්සේ විසින් මේ කිසිවක් නොකළ ද තමන් විසින් යම් ධර්මයක් දේශනා කොට ඇත්නම්, ඒ දහම මනාව පිළිපදින්නාගේ දුක් නැසීම පිණිස නිසැකව හේතු වන්නේ නම් ඉහත කී ඉල්ලීම්වලින් ඵලයක් නොමැති බව යි. එසේ ම එවැනි පොරොන්දුවක් මත තමන් සුනක්ඛත්ත සසුනට ඇතුළත් කර නො ගත් බවත් ඔහුත් එවැනි පොරොන්දුවක් මත තමා කරා නො පැමිණි බවත් බුදුන් වහන්සේ පැවසූහ. එහෙත් සුනක්ඛත්ත බුදුන් වහන්සේ තමන් කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් ඍද්ධි පෙළහර නො කරන්නේ යැයි සිතා වෛර බැන්දේ ය.

සුනක්ඛත්තයන් තුළ වූයේ බුදුන් වහන්සේ කෙරෙහි පැහැදිලි ද්වේෂයකි. බුද්ධෝපස්ථායකව පසුපස ඇවිදින කාලයෙහි ද බුදුන් වහන්සේගේ කියමන් බොරු වෙනවා දැකීමට ඔහු තුළ බලවත් ආශාවක් වූ බවත්, ඒ සඳහා බොහෝ උත්සාහ කළ බවත්, අන්‍ය තීර්ථක අලජ්ජීන් ම ඔහුට රහතුන් හා ගුණවතුන් ලෙස පෙනුණු බවත් පාථික සූත්‍රයෙන් පැහැදිලි වේ. සුනක්ඛත්ත මහණ වෙසින් සිටිය දීම බුදුන් වහන්සේ මුසාවාද කියතැයි නිග්‍රහ කළ බවත්, ඔහු හැර බුදුන් වහන්සේට මුසාවාදයෙන් නිග්‍රහ කළ වෙනත් කිසිවෙකු නොමැති බවත් පාථික සූත්‍ර අටුවාවේ සඳහන් වේ. සසුන හැර ගිය සුනක්ඛත්ත වරක් කොරක්ඛත්තිය නම් බලු තපස් රකින බිමලූ ආහාර මුවින් ගෙන බුදින නිරුවත් තවුසෙකු වෙත ගියේය. එසේම තව වරක් ඔහු ව්‍රත සතක් සමාදන් වූ කළාරමට්ටුක නම් නිරුවත් තවුසෙකු සරණ ගියේ ය. සුනක්ඛත්තගේ පෙළඹවීමෙන් බුදුරදුන් සමග උතුරු මිනිස් දම් ප්‍රාතිහාර්ය පෑමට අභියෝග කළ පාථික පුත්‍ර නම් නිරුවත් තවුසෙකු අවසානයේ දී බියෙන් සැඟවී සිටියේ ය. උග්‍ර තපස් කෙරෙහි විශ්වාසයෙන් හා

ඍද්ධිමය සමත් කම් පිළිබඳ දැඩි ආශාවකින් පසුවූ සුනක්ඛත්ත ඒ නිසා ම නො මග ගිය තැනැත්තෙ බවට පත් විය.

බුදුන් වහන්සේ විසින් සුනක්ඛත්ත හිස් මිනිසෙක් (මොඝ පුරිස) බවත් උතුරු මිනිස් දම් වැටහීමේ නුවනක් ඔහුට නොමැති බවත් සැරියුත් තෙරුන් අබිමුව වදාරන ලදී. යමෙකුට මේ අත් බැව්හි දීම මාර්ග ඵල ලැබීමට නොහැකි වීම හෝ හේතු සම්පත් තිබිය දී මග ඵල ලැබීමට උත්සාහයක් නොමැති වීම යන කරුණින් මිනිසෙකු මොඝ පුරිස යනුවෙන් හැඳින්වේ. සුනක්ඛත්ත මේ අත් බැව්හි දීම මග ඵල ලැබීමට හේතු සම්පත් තිබිය දී ක්‍රෝධය නිසා ඒ මග වළක්වා ගත් අයෙකි. "කොධනො සාරිපුත්ත, සුනක්ඛත්තෝ මොඝ පුරිසො, කොධා ච පනස්ස එසා වාචා භාසති" යන සූත්‍ර පාඨයෙන් ඒ බව තහවුරු වේ. අනතුරුව බුදුන් වහන්සේ සාරිපුත්ත හිමියන්ට තමන් කෙරෙහි පවත්නා උතුරු මිනිස්දම් කවරේදැයි විස්තර වශයෙන් ප්‍රකාශ කළහ.

## උත්තර මනුෂ්‍ය ධර්ම

සමථ හා විදර්ශනා යනුවෙන් බුදුසමයෙහි ඉගැන්වෙන භාවනා ක්‍රම තුළින් ධ්‍යාන අභිඥා ආදී වූ කාය බල ඉක්මවාගිය මානසික බල උපදවා ගත හැකි ය. භාවනාව ආධ්‍යාත්මික විද්‍යාවකි.[V] විමුක්ති මාර්ගය වසාලන කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්දච්ච කුක්කුච්ච හා විචිකිච්ඡා යන නීවරණ භාවනා මාර්ගයෙන් සංසිඳීමෙන් සමාපත්ති අභිඥා උපදවා ගැනීමට හැකියාව ලැබේ. විදර්ශනා භාවනාවෙන් සත්වයා සසරට බැඳ තබන සක්කාය දිට්ඨි ආදී දස සංයෝජන ප්‍රහීන කිරීමෙන් ආර්ය භාවය ප්‍රකට වන ප්‍රඥාව වර්ධනය වේ. භාවනාවෙන් සිතේ සමාධි ඉන්ද්‍රිය බලවත් වීමේ ප්‍රතිඵල වශයෙන් භාවනානුයෝගීන් තුළ උත්තරමනුෂ්‍ය ධර්ම නම් වූ බලවත් වූ මානසික ශක්ති ඉස්මතු වීමට පටන් ගනී. බුදුන් වහන්සේ විසින් උපයා ගන්නා ලද විවිධ වූ ඥාන විශේෂ පිළිබඳ ත්‍රිපිටකයේ නොයෙක් තැන සඳහන් වේ. සිත්හි සමාධිය වැඩීමෙන් ලද හැකි ඥාණබල පිළිබඳ වර්ගීකරණයක් අභිධර්ම පිටකයේ



විභංගප්පකරණයේ ඥාණ විභංගය කොටසේ ඇතුළත් වේ.[vi] ඥාණ බල ප්‍රභේද වශයෙන් ෂඩභිඥා, සත්සැත්තෑඥාණ, තෙසැත්තෑඥාණ, සමාපත්ති ආදී වශයෙන් විභංගප්පකරණයේ විස්තර කොට ඇත. මේ අතරින් මහා සීහනාද සූත්‍රයේ විස්තර වන ඥාණ බල වර්ග පහකි.

1. දසබල ඥාණ
2. චතුවේසාරජ්ජ ඥාණ
3. අට්ඨාසු පරිසාසු අකම්පන ඥාණ
4. චතුයෝනි පරිච්ඡේදක ඥාණ
5. පංචගති පරිච්ඡේදක ඥාණ[vii]

## තථාගත දසබල

බුදුන් වහන්සේ කෙරෙහි වූ සුවිශේෂ උත්තර මනුෂ්‍ය ධර්ම පෙන්වාදීම සඳහා ථේරවාද හා මහායාන යන බෞද්ධ සම්ප්‍රදායන් දෙකම එක ලෙස ප්‍රයත්න දරා තිබේ. ඒ අතරින් දස බල ඥාණ වශයෙන් වර්ගකොට ඇති උත්තර මනුෂ්‍ය ධර්ම විශේෂය කැපීපෙනෙයි. තථාගතයන් වහන්සේ තුළ පැවති දස බල ඥාණ විස්තර සංස්කෘත අර්ථ විනිශ්චය සූත්‍රයේ ද ඇතුළත් වේ.[viii] මහා සීහනාද සූත්‍රයේ සඳහන් වන තථාගත දස බල පහත දැක්වෙන පරිදි ය.

1. තථාගතයෝ කාරණය කාරණය වශයෙන් ද, ආකාරණය ආකාරණය වශයෙන් ද තතු ලෙස දනිති.
2. තථාගතයෝ අතීත, අනාගත හා වර්තමාන යන තුන් කල් අයත් කර්මයන්ගේ විපාකවල හේතු ප්‍රත්‍ය තතු ලෙස දනිති.
3. තථාගතයෝ සත්වයින් නිරයාදී සෑම තැන් යන සර්වත්‍රගාමී ප්‍රතිපදාව තතු ලෙස දනිති.

0 2 MAY 2012

4. තථාගතයෝ අනේක ධාතු නානාධාතු ලෝකය තතු ලෙස දනිති.
5. තථාගතයෝ සත්වයින්ගේ නානාධිමුක්ති භාවය තතු ලෙස දනිති.
6. තථාගතයෝ සත්වයින්ගේ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේ වර්ධනය හා හීනභාවය තතු ලෙස දනිති.
7. තථාගතයෝ ධ්‍යාන, විමෝක්‍ෂ, සමාධි, සමාපත්තීන්ගේ කෙලෙසීම ද පිරිසිදු බව ද නැගී සිටීම ද යථා පරිදි දනිති.
8. තථාගතයෝ අනේක පෙර විසූ ජාති සිහි කරති.
9. තථාගතයෝ සුගතියට හා දුගතියට ගිය සත්වයන් දිවැසින් දකිති.
10. තථාගතයෝ ආශ්‍රවයන් ක්‍ෂය වීමෙන් ආශ්‍රවරහිත චේතෝවිමුක්තියත් පඤ්ඤාවිමුක්තියත් ඉහාත්මයේ දීම විශිෂ්ට ඤාණයෙන් දැන ඊට පැමිණ වාසය කෙරෙති.

## සිව් විශාරදභාවයන්

මේ ධර්මය ඔබ විසින් අවබෝධ කොට නැත" යනුවෙන් චෝදනා කරන පුද්ගලයෙකු හෝ චෝදනා කාරණයක් හෝ අවබෝධ නොකළ ධර්මයක් හෝ නොදක්නාවූ බුදුන් වහන්සේ තුළ බලවත් සොම්නසක් උපදී. එම සොම්නස හා යෙදුණු නුවණ වෙසරද බව නම් වේ. මේ නිසා උන්වහන්සේ ඛේම හෙවත් නිර්භය භාවය පැමිණියේ ය. එබඳු විශාරද භාවයන් සතරකි. ගෞතමයන් වහන්සේගේ සම්මා සම්බුද්ධත්වය, ආශ්‍රව ධර්ම ප්‍රහීණ කිරීම, මාර්ගඵල හා නිවන යන උත්තරීතර තත්වයන් පිළිබඳ නිසැකභාවයකින් හා ස්ථිරත්වයකින් ලොවට ප්‍රකාශ කරනු ලැබීම මෙයින් අර්ථවත් කෙරෙයි. වෙනත් කිසිදු ශාස්තෘවරයෙකුට හෝ ධ්‍යාන ලාභියෙකුට මෙබඳු වූ විශ්වාසයක් තමන් කෙරෙහි උපදවා ගතහැකි බව ප්‍රකාශ කළ හැකි දැයි සැකසහිත ය. එබැවින් සිව් විශාරදභාව පිළිබඳ නුවණ බුදුරදුන් විෂයෙහි ම වූවකි.



1. සම්මාසම්බුද්ධ වෙමියි ප්‍රතිඥා කරන බුදුරදුන්ට මේ ධර්මය අවබෝධ නොකරන ලදැයි ප්‍රතිචෝදනා නැගීමට සමතෙකු නොමැති වීම.
2. ක්ෂීණාශ්‍රව බව ප්‍රතිඥා කරන බුදුරදුන්ට මේ ආශ්‍රවය ක්ෂය නොකරන ලදැයි ප්‍රතිචෝදනා නැගීමට සමතෙකු නොමැති වීම.
3. මාර්ගඵල සඳහා අන්තරායකර යම් ධර්මයක් කියන ලද නම් එය එසේ නොවේ යැයි කීමට කිසිවෙකු නොමැති වීම.
4. යම් ධර්මයක් පිළිපදින්නාගේ දුක් කෙළවර කිරීම පිණිස පවතින්නේ යැයි දේශනා කරන ලද නම් එය එසේ නොවේ යැයි කීමට කිසිවෙකු නොමැති වීම.

## අට පිරිස් කෙරෙහි අකම්පිතවීම

බුදුන් වහන්සේ කෙරෙහි සතර විශාරදභාවයන් පිහිටි බැවින් උන්වහන්සේ මිනිසුන්, දෙවියන්, මරුන් හා බඹුන් ඇතුළු සියලු පිරිස් වෙත අකම්පිතව හා නිර්භයව එළැඹ ධර්මය දේශනා කරති. එම පිරිස් ක්‍ෂත්‍රිය, බමුණු, ගෘහපති, ශ්‍රමණ, චාතුර්මහාරාජික, තාවතිංස, මාර, බ්‍රහ්ම වශයෙන් අට වැදෑරුම් වෙති. සිය ගණන් වූ, දහස් ගණන් වූ මේ පිරිස් වෙත එළැඹෙන බුදුන් වහන්සේට ඔවුන්ගේ ස්වරූපය නිසා හෝ ප්‍රගුණකළ විද්‍යාවක් නිසා හෝ වාදයක් නිසා හෝ භයක් හෝ තැතිගැන්මක් ඇති නොවේ. උග්‍ර බල ඇති ක්‍ෂත්‍රියෝ ද ත්‍රිවේදයේ පරප්‍රාප්ත බමුණෝ ද විවිධ විද්‍යාවන්හි දක්‍ෂ ගෘහපතියෝ ද වාදයෙහි දක්‍ෂ ශ්‍රමණ පිරිස ද බුදුන් වහන්සේගේ දේශනාව අබිමුව පරාජයට පත්වූහ. අන් සක්වල වෙසෙන සිය ගණන් දිව්‍ය පිරිස ද මාර පිරිස ද බ්‍රහ්ම පිරිස ද බුදුන් කරා විවිධ වේෂයෙන් එළැඹෙති. එසේ වූයේ නමුදු බුදුරදුන් කෙරෙහි බියෙන් තැති ගැන්මෙන් නොවන බව අටපිරිස් වෙත අකම්පිත ව එළැඹීමේ ඤාණයෙන් ප්‍රකට කෙරේ. සම්බුද්ධ දේශනාව කරුණාව හා ප්‍රඥාව තේමා කොට ලොව පතුරන ලද දහමකි. එය යුද්ධය, අවි ආයුධ හෝ භීතිය යොදා ගනිමින් මිනිසා වෙත බලෙන් පටවන ලද දහමක් නොවේ. සියලු ලෝ සතුන් වෙත මහත් කරුණාවකින් තිළිණ කළ මොහාන්ධකාරය

43843

දුරලා ප්‍රඥා ප්‍රදීප දල්වාලන බුද්ධ භාෂිතයට කිසිවකුගේ අභියෝගයකින් නොසැලී, නොමැඩී, අකම්පිතව සැම පිරිස් අභිමුව විරාජමාන විය හැකි වීම සුවිශේෂ ලක්‍ෂණය කි.

## සිව් යෝනි පිරිසිඳ දැනීමේ ඥාණ

ලොව සත්වයාගේ උප්පත්තිය විශ්මයජනක ය. කරණීයමෙත්ත සූත්‍රයෙහි ලොව උපදින විවිධ සත්ව කොට්ඨාස පිළිබඳ සඳහන් වේ. මනුෂ්‍ය, තිරිසන්, යක්‍ෂ, ප්‍රේත, භූත, දේව, බ්‍රහ්ම ආදී වූ නානා විධ සත්ව කොට්ඨාශ මෙන් ම කාම සුගති, කාම දුගති, රූප, අරූප ආදී ලෝකවල උපදින්නා වූ සත්වයින් වශයෙන් ද මෙම සත්ව වර්ගීකරණය ඉදිරිපත් කොට ඇත. තවත් විටෙක සත්වයාගේ උප්පත්ති ස්ථානවල විවිධත්වය ඔවුන්ගේ ජීවන පැවැත්මට උපකාරීවන ආහාර ස්වභාවය අනුව වර්ග කොට ඇත. මෙසේ ත්‍රිපිටකාගත සූත්‍රවල විවිධ ආකාරයෙන් සත්ව කොට්ඨාස වර්ගීකරණය කොට තිබීමෙන් පැහැදිලි වන්නේ බුදුසමය එක්එක් අවස්ථාවන්ට අනුව විවිධ දෘෂ්ටිකෝණවලින් ඒ පිළිබඳව විග්‍රහ ඉදිරිපත්කොට ඇති බවයි. ඒ අනුව සත්වයා පිළිබඳ ගැඹුරු දර්ශනයක් බුදුසමයේ අන්තර්ගත බව පෙනේ. මෙහි වඩාත් ගැඹුරු විග්‍රහයක් වන්නේ සත්වයාගේ උත්පත්තිය යෝනි වශයෙන් සලකා බැලීමයි. මෙම සූත්‍රයෙහි යෝනි යනු උත්පත්ති ස්වභාවය අනුව සත්වයා වර්ග කෙරෙන ආකාරය යි. සත්වයා කොතැනක කවර ආකාරයකින් උත්පත්තිය ලැබුවද යෝනි වශයෙන් හඳුන්වන ආකාර සතරින් එකකට අයත් වේ.[ix] සත්වයාගේ ස්කන්ධ ස්වභාවය උත්පත්තිභාවය අනුව දැක්වීම සඳහා සූත්‍රයේ යෝනි යන යෙදුම භාවිත කොට ඇත. මෙහි දී යෝනි යනු ස්කන්ධ කොට්ඨාසය යි. සත්වයා භවයට පැමිණෙන එබඳු යෝනි සතර කි.

1. බිජුවට බිඳ ඉපැදීම (අණ්ඩජ)
2. වස්තිකෝෂය බිඳ ඉපදීම (ජලාබුජ)
3. කුණු මසෙහි (සංසේදජ) ඉපදීම
4. ඉබේ පහළ වීම (ඕපපාතික)



උත්පත්ති ස්වභාවය අනුව සළකා බැලීමේ දී පක්ෂින්, මත්ස්‍ය වර්ග හා සර්ප වර්ග සාමාන්‍යයෙන් බිජුවටින් හටගන්නා සත්වයෝ වෙති. වැදෑමස තුළ ප්‍රතිසන්ධිය ලැබ ප්‍රසූත වන සත්වයෝ ජලාබුජ නම් වෙති. මිනිසුන් හා සිව්පා ආදී බොහෝ තිරිසන් සතුන්ගේ උප්පත්තිය සාමාන්‍යයෙන් මේ ගණයට අයත් වේ. පුෂ්පගර්භ, මඩගොහොරු, පිළුණු මස් ආදියෙහි හටගත් සංයෝග නිසා සත්වයාගේ උත්පත්තිස්ථාන ඇති වේ. චාතුර්මහාරාජිකයේ පටන් මත්තෙහි සියලු දෙවියෝ ද බ්‍රහ්මයෝ ද නිරයගාමී සත්වයෝ ද ඕපපාතිකව උපදිති. බුමාටු දෙවියෝ සිව්යෝනිවල ම උපදිති. අටුවාවෙහි දක්වා ඇති පරිදි බහුල වශයෙන් මිනිස්සු ජලාබුජ වශයෙන් උපදිති. මිනිසුන් වෙනත් යෝනිවල උපත ලැබූ අවස්ථා බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. කුන්තක පුත් දෙබෑ තෙරුන් මෙන් අණ්ඩජ වශයෙන් ද පියුම් ගැබක උපන් පොක්කරසාති හා පද්මාවති දේවී ආදීන් මෙන් සංසේදජ වශයෙන් ද මිනිසාට වෙනත් යෝනි ලැබිය හැකි බව සඳහන් වේ. කලාතුරකින් මිනිසෙකු ඕපපාතිව පහල විය හැකි ය.

නවීන විද්‍යාවේ හා තාක්‍ෂණයේ උපකාරයෙන් මනුෂ්‍යයාගේ උත්පත්ති ස්වභාවය වෙනස් කිරීමට උත්සාහ කරන අවස්ථා දැකිය හැකි ය. ක්ලෝනකරණය යනුවෙන් හඳුන්වන සත්ව පිටපත් නිපදවීම වැනි නවීන ක්‍රියාකාරකම් වර්තමාන සමාජය තුළ මිනිස් සම්බන්ධතා හා ස්වභාවික උත්පත්තිය විපර්යාස කිරීමට හේතු වනු ඇත. මිනිසාගේ ස්වභාවික උත්පත්තිය විද්‍යාව මගින් වෙනස් කිරීම නිසා මානව සංහතියේ ඉරණම කෙබඳු විය හැකි දැයි සාකච්ඡා කළ යුතු කරුණකි. නල දරුවන්, ජාන පිටපත්කරණය හා ශුක්‍රාණු බැංකු සම්බන්ධ නව නිපැයුම් හා සොයාගැනීම් නිසා මිනිසාගේ උපත පිළිබඳ නව මානයන් ලොව ඉදිරියේ නිර්මාණය වී ඇත. මේවා සාම්ප්‍රදායික වශයෙන් පිළිගනු ලබන මිනිසාගේ සාමාන්‍ය උත්පත්ති ස්වභාවය වෙනස්වීම හෝ වෙනස් කිරීම කෙරෙහි සෘජුව ම බලපෑම් කරයි. කෙසේ වෙතත් යෝනි වශයෙන් හඳුනා ඇති ආකාර සතර ඉක්මවූ පස්වැනි උත්පත්ති ස්වභාවයක් තිබිය නොහැකි වීම විශේෂත්වයකි. මෙම සතර යෝනි පිළිබඳ සඳහන් කරමින්

02 MAY 2012

බුදුන් වහන්සේ සත්වයාගේ උත්පත්තිය, ස්කන්ධයාගේ පහළවීම, ජාතිය, අභිනිබ්භිජ්ජතිය මැනවින් ප්‍රකට කළහ. එසේ ම කිසියම් සත්ව කොට්ඨාසයක් කිසියම් යෝනියක පහලවීමට විශේෂ වූ එක් ක්‍රමයක් නොමැති අතර එය සංකීර්ණ ස්වභාවයක් දරන බව බුද්ධ දේශනාව අනුව පෙනේ. නිදසුනක් ලෙස මිනිසාගේ සාමාන්‍ය උත්පත්තිය ජලාබුජ වශයෙන් සිදුවන නමුදු විශේෂ අවස්ථාවක වෙනත් යෝනි ස්වභාවයකින් වුව සිදුවිය හැකි බව නො සිතිය හැකි තත්වයක් නො වේ. ක්ලෝනීකරණය නම් වූ නවීන ජාන විද්‍යාව විසින් ද සත්වයාගේ උත්පත්ති ස්වභාවය වෙනස් කොට තිබීමෙන් ඒ බව වඩාත් තහවුරු වේ. සත්වයාගේ උත්පත්තිය පිළිබඳ බුදුන් වහන්සේ තුළ වූ මේ ගැඹුරු ඤාණය චතුයෝනි පරිච්ඡේදක ඤාණය නමින් හඳුන්වා ඇත.

**පස් ගති පිරිසිඳ ගැනීමේ නුවණ**

නරකය, තිරිසන් යෝනිය, ප්‍රේත විෂය, මනුෂ්‍යයෝ ය, දෙවියෝ ය යනුවෙන් ගති පසෙකි. බුදුන් වහන්සේ සත්වයාගේ යම් ප්‍රතිපදාවක් වේ ද ඒ ප්‍රතිපදාව විසින් කුමන ගතියක් ලබන්නේදැයි මැනවින් දත්සේක. මේ පස් ගති කරා සත්වයා පමුණුවන ප්‍රතිපදාව, මාර්ගය පිළිබඳ බුදුන් වහන්සේ කෙරෙහි පිහිටියා වූ සුවිශේෂි ඤාණය මෙහිදී ප්‍රකාශ වී ඇත. උන්වහන්සේ කිසියම් පුද්ගලයෙකුගේ සිත මැනවින් දැන ඔහු කෙබඳු ප්‍රතිපත්තියක් ඇතිව සිට කෙබඳු ගතියක් ලබන්නේ දැයි නිසැකව ම අවබෝධ කළහ. එසේම පසු කලෙක එම ප්‍රතිපාදවේ ගමන් කිරීමේ හේතුවෙන් එම සත්වයා ඊට ගැලපෙන ගතියෙහි උපන් ආකාරය ද දකිනු ලැබේ. නිදසුනක් ලෙස ඇතැම් පුද්ගලයෙකු නිරයගාමී මාර්ගයට පිවිස සිටී ද ඔහුගේ මරණින් පසුගතිය දුක් සහිත සැපයෙන් පහවූ නිරය මිස අන් කිසිවක් නොවන බවත් එසේ ගමන් කළ තැනැත්තා පසු කලෙක නිරයේ කටුක වූ තියුණු වූ වේදනා විඳින ආකාරය දකින බවත් මෙම ඤාණයෙන් ප්‍රකට කෙරේ. පහවූ සිළු ඇති පහවූ දුම් ඇති ගිනි අඟුරු වළක් දෙසට වැටී ඇති එකම මගින් ග්‍රීෂ්මයෙන් ක්ලාන්ත වූ පුරුෂයෙක් ගමන් කරයි. ඇස් ඇති පුරුෂයෙක් මේ තැනැත්තා



ඒකාන්තයෙන් ම ගිනි අඟුරු වල දෙසට ගමන් කරන බව දකියි. එසේ ම පසු කලෙක ඔහු ඒ ගිනි අගුරු වලෙහි වැටී තියුණු වූ කටුක වූ දුක් විඳින සත්වයා දකී. පස්ගති පිරිසිඳ දැනීමේ ඤාණය පිළිබඳ උපමාවකින් එසේ දක්වා ඇත. බුදුන් වහන්සේ කිසිවකුගේ ඉගැන්වීමකින් හෝ අනුමානයකින් හො තර්කයෙන් හෝ නොව අනුභූතියෙන් ම සත්වයා කර්ම විපාක වශයෙන් ලබන උප්පත්තිය පසක් කර ගන්නා බව මෙයින් පෙන්වා දී ඇත.

උත්තර මනුෂ්‍ය ධර්ම පිළිබඳ බුදු සමය කෙසේ සලකා බලන්නේ දැයි විමසීම වැදගත් වේ. මිනිසාට විෂය ලෝකය පිළිබඳ ලැබෙන්නා වූ ඥානයෙන් සෑහීමට පත් විය නොහැකි ද? මිනිසා ඉන්ද්‍රියන් ඇසුරින් විෂය ලෝකය පිළිබඳ දැනුම ලබා ගන්නා ආකාරය මධුපිණ්ඩික සූත්‍රයේ පැහැදිලිව දක්වා තිබේ. ඉන්ද්‍රිය ලෝකය සීමිත අද්දැකීම් සහිත බැවින් සසර පවත්නා සැබෑ ස්වභාවය හෙළිදරව් නොකෙරේ. සත්වයාගේ උත්පත්තිය, සසර ස්වභාවය, කර්මය පදනම් කොට ඇති හේතුඵල ධර්මයන්ගේ ක්‍රියාකාරීත්වය, ලෝකවිෂය ආදීය පිළිබඳ ඥානය අවධි වන්නේ අතීන්ද්‍රිය අද්දැකීම් වලිනි. බුද්ධ දේශනාව තහවුරු කෙරෙන මෙවැනි සංකල්ප වලට පසුබිම් වන්නේ බුදුන් වහන්සේ හා රහතන් වහන්සේලා උත්තර මනුෂ්‍ය ධර්ම වශයෙන් හඳුන්වා ඇති ධ්‍යාන, සමාධි, සමාපත්ති, විමොක්ෂ මාර්ගයෙන් උපදවන ලද මෙම අතීන්ද්‍රිය ඥාන මාර්ගයයි. මෙම දිව්‍යමය ඥාන මාර්ග බෞද්ධ මාර්ග ලෙස ම වූ පිළිගැනීමක් නැත. බුදුරදුන්ට පෙර උද්දකරාම පුත්ත, ආළාරකාලාම ආදී තවුසන් ද ඒවා යම් යම් ප්‍රමාණ වලින් උපදවා ගෙන සිටියහ.[xi] එහෙත් ඒවා නිවන, විරාගය, කෙලෙස් සන්සිඳවීම, විවිශේෂ ඤාණය වැනි බෞද්ධ ප්‍රතිපදාව පිණිස නොවීය. ධ්‍යාන භාවනාවෙන් උත්තර මනුෂ්‍ය ධර්මය උපදවාගත් බුද්ධ කාලීන භාරතයේ තවුසන් ඒවා ලබාගන්නා ලද්දේ සීමිත මට්ටම්වලිනි. යමෙක් යම් දිව්‍යමය වූ අතීන්ද්‍රිය ශක්තියක් ලබන ලද්දේ ද එය තමන්ට හැකිතාක් වර්ධනය කොට යම් තැනක නතර වී එම ලැබූ තත්ත්වය ම විමුක්තිය කොට සිතූහ. මැනවින් ප්‍රගුණ නොකළ උත්තර මනුෂ්‍ය ධර්ම විමුක්ති මාර්ගයේ ගමන් ගන්නාහට

බලවත් වූ බාධාවක් බවට පත් විය හැකිය. එසේම කිසිවෙක් එය මිනිසුන් මුලා කිරීමේ හා ලාභ ඉපැයීමේ මාර්ගයක් වශයෙන් භාවිත කරති. සම්පසාදනීය සූත්‍රයේ දැක්වෙන පරිදි බුදුන් වහන්සේට වැඩි තරම් නුවණ ඇති අන් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ පෙරත් නොවීය. දැනුත් නොවන්නේය. මතුත් නොවන්නේ ය යනුවෙන් සිංහනාදයක් පවත්වන ලදී. එහෙත් උදායී තෙරුන් වහන්සේ පවසන්නේ මෙබඳු මහත් ඍද්ධි ඇති තථාගතයන් වහන්සේ අල්පේච්ඡතාව, සන්තුෂ්ටතාව හා සල්ලේඛතාව වැනි අසිරිමත් ගුණ නිසා ඒවා හෙළි නොකරන බවයි. ඍද්ධි ප්‍රාතිහාර්ය මගින් මිනිසුන් නොමග යවා තම දහමට කැඳවීම බුද්ධ දේශනාවට එකඟ නැත. බුදුන් වහන්සේගේ ප්‍රතිපදාව වූයේ දේශනා ප්‍රතිහාර්යෙන් මිනිසා ධර්ම මාර්ගයට නැංවීමයි. කරුණාවෙන් සිසිල් වූ හදවතත් මොහාන්ධකාරය නසන ප්‍රඥාලෝකයත් ඍද්ධිමය සමත්කම්වලට වඩා වූ උතුරු මිනිස් දම් බව සම්බුද්ධ දේශනාවේ පැහැදිලි වේ.

## අචේලකත්ව ආදී තපස් ව්‍රත

බුද්ධ කාලීන සමාජයේ පැවතියා වූ උග්‍ර තපස් ව්‍රත පිළිබඳ විස්තරයක් සූත්‍රයෙහි දෙවන භාගයේ කිය විය හැකි ය. සිද්ධාර්ථ තාපසයාණන්ගේ සය වසක් පමණ වූ තාපස අවධිය ශරීරයට දැඩි දුක් දීම නම් වූ අත්තකිලමථානුයෝගී ප්‍රතිපදාවෙන් නොසිස් විය. අත්තකිලමථානු යෝගය කාමසුඛල්ලිකානු යෝගයට සාපේක්ෂව ගත් කල පහත් ප්‍රතිපදාවක් ලෙස සළකා නොමැති බව එම ප්‍රතිපදාවන් දෙක පිළිබඳ ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාවේ සඳහන් කොට ඇති වචන වලින් පැහැදිලි වේ. ඒ අනුව කාමසුඛල්ලිකානුයෝගය පිළිබඳ විස්තර කොට ඇත්තේ හීනෝ, ගම්මෝ, පෝථුජ්ජනිකෝ, අනරියෝ, අනත්ථසංහිතෝ යනාදී වශයෙනි. එසේ වූවත් අත්තකිලමථානුයෝගය දුක්ඛෝ, අනරියෝ, අනත්ථසංහිතෝ යනුවෙන් විස්තර කොට ඇත.[xii] මෙහිදී බුදුන් වහන්සේ කිසිවෙකුට නොදෙවෙනි ලෙස අචේලකාදී උග්‍ර තපස් ව්‍රත පිළිපදිමින් සිටි බව ප්‍රකාශ කළහ.



සුනක්ඛත්ත දුෂ්කර ප්‍රතිපදා අනුගමනය කිරීම තුළින් විමුක්තිය ලද හැකියැයි විශ්වාසයක් ඇතිව සිටි තැනැත්තෙකි. ඔහු අවස්ථා කිහිපයක දී කොරක්ඛත්තිය, කළාරමට්ඨුක ආදී නිරුවත් තවුසන් වෙත ගියේ ය. බුදුන් වහන්සේ අත්තකිලමථානුයෝගී ප්‍රතිපදාවේ නිෂ්ඵලභාවය දක්වනු පිණිස තමන් වහන්සේගේ අද්දැකීමෙන් ම සඳහන් කරන ලදී. කෙසේ වූවත් මෙහි විස්තර වන සමහර රලු පිළිවෙත් බෝසතුන් අනුගමනය කළ බව ප්‍රකාශ කිරීම අතිශයෝක්තියක් බව පෙනේ. සූත්‍ර සංග්‍රහකාරක භික්ෂූන් එවකට භාරතයේ අචේකල ආදී උග්‍ර තාපස පිරිස විසින් අනුගමනය කළ සියලුම අකාරයේ පිළිවෙත් මෙහි ඇතුළත් කොට ඒවා නිෂ්ඵල බව ප්‍රකාශ කළා විය යුතු ය. බුදුන් වහන්සේ සාරිපුත්ත තෙරුන්ට මෙකී ප්‍රතිපදාවෙන් මනුෂ්‍ය ධර්මයට වැඩි වූ ආර්ය භාවයක් නොලත් බව ප්‍රකාශ කළහ. තවුසන් විසින් පහත සඳහන් ආකාරයේ ඇවතුම් පැවතුම් සම්බන්ධව රූක්ෂ පිළිවෙත් පුරන ලදී.

1. ආහාර පිළිබඳ පිළිවෙත්
2. වස්ත්‍ර පිළිබඳ පිළිවෙත්
3. දුෂ්කර ඉරියව් පැවැත්ම
4. තිරිසන් සතුන් අනුකරණය කිරීම
5. වාසස්ථාන පිළිබඳ පිළිවෙත්
6. යාග කිරීම

## ආහාර පිළිබඳ පිළිවෙත්

උපවාසය, නිරාහාරවීම, ආහාරය සීමා කිරීම වැනි ප්‍රතිපත්තිවල පිහිටා කටයුතු කිරීමෙන් කෙලෙස් ප්‍රහීණ කිරීමට දරන උත්සාහය භාරතීය ආගමික සම්ප්‍රදායන්හි පොදුවේ දක්නට ලැබේ. මෙය බලවත් වීමෙන් ආහාරයෙන් ශුද්ධිය ඇති වේය යන මිථ්‍යා දෘෂ්ටියක් හටගනී. මෙම ප්‍රතිපදාවන්හි ප්‍රතික්ෂේප කළ ආහාර වර්ග කිහිපයකි.

- එන්න කියා හෝ සිටින්න කියා දෙන ආහාරය

- පළමු කොට ගෙනා හෝ උදෙසා කළ හෝ නිමන්ත්‍රණය කළ හෝ ආහාරය
- කළයෙන් හෝ සැළියෙන් නගා දෙන ආහාරය
- එළිපත අතර සිට දෙන ආහාරය
- දණ්ඩක් අතර හෝ මෙහොලක් අතර සිට දෙන ආහාරය
- අනුභව කරන්නන් අතර සිට දෙන ආහාරය
- ගැබිනියක හෝ කිරි පොවන්නියක විසින් දෙන දෙය
- පුරුෂයා වෙත ගිය තැනැත්තිය විසින් දෙන දෙය
- සම්මාදම් කළ දෙය
- අසල සිටි බල්ලාට නොදී දෙන දෙය
- මැස්සන් ඇති තැන දෙන දෙය

එසේම නොවළඳ ආහාර ලෙස දියමස්, ගොඩමස්, සුරා, පුෂ්පාසව, සියලු ධාන්‍යවලින් සාදා ගත් කැඳ ආදිය වේ. අනුභව කළ හැකි රළු ආහාර වශයෙන් අමු පලා, බඩහමු, ඌරුහැල්, කපාහල සම් කසට, මැලියම්, සහල් කුඩු, දඹු බත්, පුනක්කු, තණ කොළ, ගොම, වනමුල් පල, ස්වයංපතිත ඵල ආදිය වේ. මහා විකට භෝජනය වශයෙන් ගොනුන් හා ගොපල්ලන් පිටත්ව ගිය පසු දෙනුන් වෙත කිරි බීමට පැමිණෙන වසුපැටවුන්ගේ ගොම දෙවැලමිට බිම තබා අනුභව කිරීම හා ස්වකීය මළමුත්‍ර අනුභව කිරීම සඳහන් වේ. එසේ ම පිණ්ඩපාතයෙන් යැපීමේ දී ද විවිධ පිළිවෙත් පුරන ලදී.

- එකම ගෙයකින් ගත් ආහාරයෙන් යැපීම, එකම පිඬකින් යැපීම
- ගෙවල් දෙකකින් පමණක් යැපීම, පිඬු දෙකකින් පමණක් යැපීම
- පිඬු පිණිස ගෙවල් සතකින් පමණක් යැපීම, පිඬු සතකින් පමණක් යැපීම
- එක් කුඩා බත් තැටියකින් හෝ දෙකකින් හෝ බත් තැටි සතකින් යැපීම



- දවසකට වරක් හෝ දෙදවසකට වරක් හෝ සත් දිනකට වරක් ආහාර ගැනීම
- අඩමසකට වරක් ආහාර ගැනීම වශයෙන් පිළිවෙත් පුරණු ලැබේ.

ආහාර නොගැනිම හෝ පිළිකුල් ලාමක ආහාරයෙන් කෙලෙස් සංසිඳුවීමට හා ආත්ම දමනයට හැකි යැයි යම් තවුසකු සිතන්නේ නම් එම පිළිවෙත අත්කිසිවෙකුටත් වඩා දැඩිව පුරණ ලද්දේ බෝසතුන් විසිනි. ආහාරයෙන් ශුද්ධිය වෙතැයි කියන සමහර මහණ බමුණෝ ඩෙබර ගෙඩි කති. එසේ කියන ඔවුහු ඩෙබරපල මෙන් ම ඩෙබරසුණු ද කති. ඩෙබර මිරිකා දිය ද බොති. නත් වැදෑරුම් ඩෙබරින් කළ ආහාර ද කති. එහෙත් බෝසතුන්ට එකම ඩෙබරපලයක් ආහාරය විය. එසේ නිරාහාර වීමෙන් උන්වහන්සේගේ සිරුර කලුවැල් පුරුක් මෙන් කෘෂ බවට පත් විය. කොඳු ඇට පෙළ වටඇටවැල මෙන් පෑදිණි. නිසිදන මාංශ ප්‍රදේශය ඔටු පිය මෙන් ද ඉළ ඇට පෙදෙස දිරූ ශාලාවක යටිකුරුව නැමුණු ගොනැස්ස මෙන් ද විය. අක්ෂි කූපයන්හි නෙතු යුග ලිංපත්ලෙහි තරුකැට දෙකක පිළිබිඹු මෙන් පතුලට ගිලී ගියේ ය. මෙබඳු වූ අල්පාහාරය නිසා හිසේ සිවිය තිත්ත ලබුවක් අව්වෙන් වියැලී යන්නාසේ පැළී මැලවී ගියේ ය. උදර සිවිය පිරිමදින විට පිටකටුව ස්පර්ශ විය. පිටකටුව පිරිමදින විට උදර සිවිය හසු විය. මළ මූ පහ කරන විට යටිකුරුව වැටුණි. ආහාරය පිළිබඳ රලු පැවැත්ම කෙතරම් උග්‍ර වී දැයි මෙයින් පැහැදිලි වේ. බුදුන් වහන්සේ දුෂ්කර ප්‍රතිපදාව හැර මැදුම් පිළිවෙත පිවිසි විට පස්වග මහණහු උන්වහන්සේ අත්හැර දැමූහ. තමන් කරා වැඩි බුදුන් වහන්සේගෙන් තවුසෝ මෙසේ විමසූහ. ඇවැත් ගෞතමයෙනි දුෂ්කර ඉරියව්වෙනුත්, දුෂ්කර ප්‍රතිපාදවෙනුත්, දුෂ්කර ක්‍රියාවෙනුත් ආර්යභාවය ඇති කිරීමට සමත් ඥාන දර්ශන විශේෂයක් ලැබීමට නොසමත් වූ ඔබ ප්‍රධන් වීර්ය හැර පිරිකර බහුල කොට කෙසේ එබන්දක් ලබන ලද්දේද? යනුවෙනි.[xiii] බුද්ධ කාලීන ශ්‍රමණ හා තාපස සම්ප්‍රදායන් විසින් දුෂ්කර ප්‍රතිපදාව විමුක්ති මාර්ගයක් වශයෙන් කෙතරම් විශ්වසනීයත්වයකින් පිළිගෙන පැවතිදැයි මෙවැනි ප්‍රකාශවලින් පැහැදිලි

වේ. එහෙත් බුදුන් වහන්සේ එම අදහස් ප්‍රතික්ෂේප කොට මැදුම් පිළිවෙත තුළින් සියලු කෙලෙස් නසා අර්හත්භාවය හා සම්මා සම්බුද්ධත්වය ලද බව වදාළහ.

## වස්ත්‍ර පිළිබඳ පිළිවෙත්

නොයෙක් ආකාරයේ රළු වස්ත්‍ර දැරීමේ පටන් නග්නව විසීම දක්වා මෙම වස්ත්‍ර පරිහරණය පිළිබඳ දුෂ්කර පිළිවෙත් විවිධ වේ. තවුසන් විසින් වස්ත්‍ර දැරීම කෙලෙස් වැඩීමට හේතු වශයෙන් සලකා සාමාන්‍ය ජනයා පිළිකුල් කළ වස්ත්‍ර දැරීමෙන් දුෂ්කර ව්‍රත අනුගමනය කරන ලදී. හණ වැහැරි, නූල් වැහැරි, මිනීඑතු පිළි, පස් වැකුණු පිළි, රුක් පතුරෙන් කළ පිළි, අඳුන් දිවිසම්, අඳුන් මුව සම්, කුස තණ වැහැරි, තියඳ හණ වැහැරි, ප්‍රවරු වැහැරි, කෙස්වලින් කළ කම්බිලි, අස්ලොමින් කළ කම්බිලි, බකමූහුණු පියාපතින් කළ වස්ත්‍ර ආදී රළු වස්ත්‍ර මේ අතර තිබූ බව සඳහන් වේ.

## දුෂ්කර ඉරියව් පැවැතුම්

කෙස් රැවුල් ඉදිරීම, ආසන පිළිකෙව් කිරීම, උඩුකුරුව සිටීම, උක්කුටිකයෙන් හිඳීම, කටු සවිකල පුවරුවෙහි සක්මන් කිරීම, කටු ඇතිරියෙහි සයනය කිරීම, දිනකට තුන්වරක් ජලයට බැසීම ආදී පිළිවෙතෙහි නැවත නැවත යෙදීම ආත්මය තැවීම පිණිස වූ දුෂ්කර අනුයෝග ලෙස සලකන ලදී. සිරුරෙහි වසර ගණන් තැවරුණු දූහුවිලි දැලිවලින් හටගත් පැළිවල ඇතිව වාසය කළ ද එබඳු රජස් දැලිවලින් වැකුණු සිරුර අතින් පිරිමදින්නෙමි කියා හෝ අදහසක් බෝසතුන්ට නොවී ය. උන්වහන්සේගේ උපේක්ෂා විහරණයේ උග්‍රභාවය මෙවැනි රළු පැවැතුම් මගින් පෙන්නුම් කෙරෙයි. සොහොන් බිම මිනී ඇට මත්තෙහි සයනය කරන අවස්ථාවේ දී ගොපලු කොල්ලෝ බෝසතුන්ගේ සිරුරට කෙළ ගසත් පස් ද විසුරුවත්, කිසිවක් කථා නොකරන උන්වහන්සේගේ කන්වල ඉරටු ද ගසත්. එහෙත් බෝසතුන් තුළ උන්



කෙරෙහි ද්වේෂ කෝපාදී පව්ටු සිතක් ඇති නොවීය. කුඩා පණුවකු වුව නොමරම්වායි සිහිඇතිව ම ගමන් කිරීමෙන් ද කුඩා දියබිඳුවෙහි පවා දයාව උපදවා වාසය කිරීමෙන් ද සියලු ආකාරයේ පාපයන් පිළිකුල් කරන ලදී. එළිමහන් වාසය තුළින් සීත උෂ්ණ ආදී වූ සොබා දහමේ කටුක අවස්ථාවන් උපේක්ෂාවෙන් විඳ දරා ගැනීම ප්‍රගුණ කෙරිණි. බිහිසුණුවූ ලොමු දැහැගන්නා වනයෙහි, හිම වැටෙන හේමන්ත ඍතුවට අයත් නවම් මැදින් දෙමස අතර අට දවසෙහි සීත රාත්‍රීන්හි එළිමහනෙහි ද දහවල වනළැහැබෙහි ද විසීමෙන් බෝසතුන් එළිමහන් වාසයේ සීතල කටුක බව උපේක්ෂාවෙන් දරා සිටියහ. එමෙන් ම උන්වහන්සේ ගිම්හානයේ පශ්චිම මාසයෙහි දී දහවල් එළිමහනේ ද රාත්‍රිය උණුසුමින් යුත් වනයේ ද විසූහ. බුදුන් වහන්සේ වරක් අලව් රට ඇට්ටේරිය වනයේ ගොනුන් ගමන් කොට දැඳුරු වූ මාර්ගයක් අසල කොළ ඇතිරිය මත හිම වැටෙන සීත රාත්‍රියක් පහන් කළ පුවතක් පිළිබඳ සඳහන් වේ.[xiv]

මානය නැසීම පිණිස ප්‍රකෘෂ්ට විවේකය උතුම් ප්‍රතිපදාවෙකි. බෝසතුන් වහන්සේ කිසිවෙකු තමන් නොදකිම්වා යන අදහසින් වනයෙන් වනයට සැඟවී ගියහ. ලැහැබින් ලැහැබට, මිටි බිමින් මිටි බිමිට, උස් බිමින් උස් බිමට පලාගියහ. ශූන්‍යාගාරය අපිස් දිවියේ වැදගත් අංගයකි. ශ්‍රාවක හිතෛෂී වූ අනුකම්පාකරන සුලු වූ ශාස්තෘවරයෙකු වශයෙන් බුදුන් වහන්සේ මෙසේ වදාළහ. "මහණෙනි, මේ රුක් මල් ඇත. මේ ශූන්‍යාගාර ඇත. ඒවාට වී භාවනා කරව්. නොපමාවවු. අවසානයේ දී පසුතැවෙන්නෝ බවට පත් නොවව්" යනුවෙනි.[xv] ධ්‍යාන භාවනා වැඩීමේ දී විවේකය හා ශූන්‍යාගාර වාසය පළිබෝධ දුරු කරලීමට හේතුවේ. මෙම පිළිවෙත් නිවන ඉලක්කකොට කෙලෙස් ප්‍රහීණ වීම පිණිස පවතින්නේ නම් එය භික්ෂුවට ගැළපෙන්නකි.

භික්ෂුව සිව්පසයෙන් යැපෙන්නෙකි. ධාර්මික ලෙස උපයාගත් චීවරය, පිණ්ඩපාතය, සෙනසුන හා ගිලන් පස භික්ෂුවගේ කායික මානසික පහසුව එළවයි. එය තවුස් ව්‍රතයක් නොව ප්‍රත්‍යවේක්ෂාවෙන් සම්පත්

පරිභෝග කිරීමකි. සිහියෙන් යුත් වාසයෙන් බුද්ධ ශ්‍රාවකයා කෙලෙස් දුරු කිරීමේ නිරත වේ. ප්‍රත්‍ය පරිහරණයේ දී සිතේ ඇතිවිය හැකි තෘෂ්ණා මාන දෘෂ්ටි ආදි යමක් වේ ද ප්‍රත්‍යාවේක්ෂා කොට සිහිය ඉපදවීමෙන් ඒවා දුරු කළ හැකිය. එබැවින් තෘෂ්ණා මාන ආදී කෙලෙස් වඩන සුඛ විහරණයන් මෙන් ම දෘෂ්ටි කාන්තාරයක අතරමං කරන සුලු දුෂ්කර ප්‍රතිපදාව නම් වූ රලු ඇවතුම් පැවතුම් ද අත්හැර දමන ලද සැහැල්ලු, සුභර, යථාලාභ සන්තුෂ්ටි ගුණවලින් පිරිපුන් අපිස් පැවිදි දිවිය බුදු සමයේ අගය කෙරෙයි.

## සංසාර ශුද්ධිය

බොහෝ භවයන්හි ගමන් කිරීමෙන් ඉපැදීමෙන් හෝ විසීමෙන් හෝ ශුද්ධිය ලබන්නේ යැයි දෘෂ්ටියක් ශ්‍රමණ බ්‍රාහ්මණ පිරිස් අතර විය. සුද්ධාවාස දෙව් ලොව හැර තමන් නොසැරි සැරූ භවයක් නොමැති බව සඳහන් කරමින් බුදුන් වහන්සේ සංසාර ශුද්ධිය පිළිබඳ දෘෂ්ටිය බැහැර කළහ. ශුද්ධාවාසයේ ඉපදීමෙන් මේ ලෝකයට පැමිණීමට අවස්ථාවක් නොලැබෙයි. එබැවින් බෝසත්හු ශුද්ධාවාසයෙන් බැහැර වූ සංසාරයේ ගමන් කළ හ.

## යාග ශුද්ධිය

ආගමික චාරිත්‍රයක් හා විමුක්ති මාර්ගයක් ලෙස යාගහෝමවලට බලවත් පිළිගැනීමක් භාරතයේ හිමිව තිබුණි. බෝසතුන් විසින් නොපිදූ යාගයක් හෝ ගින්නක් නොමැති බව මෙහි සඳහන් වේ. උන්වහන්සේ විසින් සසර උපන් නොයෙක් භවයන්හි දී ක්‍ෂත්‍රිය රජව හෝ බමුණුව ඉපද එවැනි යාග කරන ලදී. එබඳු වූ කිසි යාගයකින් විමුක්තිය නොලැබූ බව පෙන්වා දුන්හ. එබැවින් යාගයෙන් වන ශුද්ධියක් ද නොමැති බව ප්‍රත්‍යක්‍ෂයෙන් දැන බුදුන් වහන්සේ එය ප්‍රතික්ෂේප කළ හ.



## සාරාංශය

සුනක්ඛත්ත විසින් ඉදිරිපත් කළ චෝදනා මුල් කොට ගෙන බුදුන් වහන්සේ තත්කාලීන භාරතීය ආගමික චින්තාවන්ගේ හා අපේක්ෂාවන්ගේ නිෂ්ඵල භවය නිර්භය ලෙස පළ කළ ආකාරය මහා සීහනාද සූත්‍රයෙන් පැහැදිලි වේ. බුදුන් වහන්සේ කෙරෙහි පැවති උත්තර මනුෂ්‍ය ධර්ම එතෙක් මෙතෙක් කල් ඒවා ලබා ගන්නා ලද කිසිවෙකුටත් නොදෙවෙනි ය. එසේ වූවත් මෙම සෘද්ධිමය සමත්කම් සුනක්ඛත්ත වැනි ශාසන විලෝපි අශ්‍රැතවත් පුද්ගලයින් තමා කෙරෙහි ගෙන්වා ගැනීමට හෝ රඳවා තැබීමට උපක්‍රමයක් වශයෙන් බුදුරදුන් භාවිතා නො කළහ. උත්තර මනුෂ්‍ය ධර්ම පහළ වීමෙන් බුදුන් වහන්සේට සත්වයා හා ලෝකය පිළිබඳ නිරවුල් හා පැහැදිලි අවබෝධයක් ලද හැකි වූ බැවින් සනාතන ධර්මයක් ප්‍රකට කිරීම කළ හැකි විය. යමෙක් අති දුෂ්කර ප්‍රතිපදාවෙන් විමුක්තිය ලබන්නේය, කෙලෙස් ප්‍රහීණ කරන්නේයැයි යම් විශ්වාසයක් දරන ලද්දේ ද එය ද සැබෑවක් නොවන බව බුදුන් වහන්සේ මෙයින් පෙන්වා දුන්හ. මක්නිසාද යත් යම් අත්තකිලමථානුයෝගී සංඛ්‍යාත රළු ප්‍රතිපදාවක්වේ ද එය ලොව කිසිවෙකුටත් නොදෙවෙනි පරිදි බෝසතුන් විසින් සපුරන ලද බැවිණි. බුදුන් වහන්සේ තමන් අවබෝධ කළ ධර්මය නිර්භය ලෙස ආසභට්ඨානයේ පිහිටා සිංහ ආකාරයෙන් දෙවියන් බ්‍රහ්මයන් හා මිනිසුන් සහිත ලොවට දේශනා කළ පුවත් ඇතුළත් සූත්‍රය ලෙස මහා සීහනාද සූත්‍රය සැලකිය හැකිය. බුදුන් වහන්සේ කෙරෙහි වූ අසමසම ඥාණ බල හා බෝසතුන් විසින් අනුගමනය කළ උග්‍ර තපස පිළිබඳ හා ඒවායේ ප්‍රාමාණිකත්වය පිළිබඳ විග්‍රහය මේ සූත්‍රයේ විමසා බලා දත හැකි ය.

---

1 චූලසීහනාද සුත්ත (මජ්ඣිම නිකාය 1.2. පි.154) සීහනාද සුත්ත(දීඝ නිකාය 1.8. පි. 356), උදුම්බරික සීහනාද සුත්ත (දීඝ නිකාය 3.2. පි. 58) චක්කවත්ති සීහනාද සුත්ත (දීඝ නිකාය 3.3. පි. 96) සාරිපුත්ත සීහනාද සුත්ත (අංගුත්තර නිකාය 5. පි.402) සම්පසාදිනී සූත්‍රය හෙවත් සාරිපුත්ත සීහනාද සුත්ත (දීඝ නිකාය 3.5. පි. 168) බු.ත්‍රි.ග්‍ර.මා.

2 පපංචසූදනී නාම මජ්ඣිම නිකායට්ඨකථා සංස්. ධම්මකිත්තිසිරිධම්මාරාමථෙර,විජ්ජාසාගරමුද්දාලය, 1917 පි.274
3 මහා සීහනාද සුත්ත(මජ්ඣිම නිකාය 1.2. පි.196)
4 පාථික සුත්ත (දීඝ නිකාය 3)
5 ගමගේ, එස්.අයි. බුදුන් වදාළ අධ්‍යාත්මික ජීවිතය, තාරක ප්‍රකාශකයෝ, බලංගොඩ, පි.66
6 විභංගප්පකරණය 2., බු.ත්‍රි.ග්‍ර.මා., පි.14
7 සම්මෝහවිනොදනී නාම විභංගට්ඨකථා, ස.හේ.මු., 1932, පි. 279
8 විජේසිංහ, එස්.ඒ.ජී. හා වැවගෙදර සීලක්ඛන්ධ හිමි, බෞද්ධ සංස්කෘත මූලාශ්‍ර අධ්‍යයනය 1, කොළඹ: සමයවර්ධන, 2008. පි.257,258
9 අමරතිස්ස නාහිමි, කටුවැල්ලේගම, විශ්වය විද්‍යාව හා බුදුදහම, මරදාන: සමයවර්ධන, 2000. පි.178
10 මධුපිණ්ඩික සුත්ත (මජ්ඣිම නිකාය 1 පි.281)
11 අරියපරියේසන සුත්ත (මජ්ඣිම නිකාය 1 පි.403)
12 ධම්මචක්කප්පවත්තන සුත්ත (සංයුත්ත නිකාය 5(2) පි.270)
13 අරියපරියේසන සුත්ත (මජ්ඣිම නිකාය 1 පි.419)
14 හත්ථආලවක සුත්ත (අංගුත්තර නිකාය 1 පි.253)
15 චන්දවිමල නාහිමි, රේරුකානේ, සතිපට්ඨාන භාවනා ක්‍රමය, ශ්‍රී චන්දවිමල ධර්ම පුස්තක සංරක්ෂක මණ්ඩලය, 1955. පි.23)